# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1981 අංක 5 දරන බෙදුම් නඩු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 පෙබරවාරි මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1981 පෙබරවාරි මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක

මිල: ශත 35 යි. තැපැල් ගාස්තුව: ශත 50 යි.

# 1981 අංක 5 දරන බෙදුම් නඩු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 පෙබරවාරි මස 11 වන දින]

එල්. ඩී.—ඕ. 12/80

## ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන බෙදුම් නඩු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1981 අංක 5 දරන බෙදුම් නඩු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන බෙදුම් නඩු පනතේ 8 වන වගන්තියේ "එම මුල් මැනීමේ ගාස්තුව ඇස්තමේන්තු කිරීමේ දී අධිකරණය විසින් මෙම පනතේ පළමුවන උපලේඛනයේ දැක්වෙන ගාස්තු ප්‍රමාණයන් සැලකිල්ලට ගත යුතු ය." යන වචන වෙනුවට "එම මුල් මැනීමේ ගාස්තුව ඇස්තමේන්තු කිරීමේ දී නියෝග මගින් නියම කරනු ලබන ගාස්තු ප්‍රමාණවලට අධිකරණය විසින් අවධානය යොමු කළ යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන බෙදුම් නඩු පනතේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "මේ පනතේ පළමුවන උපලේඛනයේ දක්වා ඇති ගාස්තු ප්‍රමාණවලට අනුකූලව" යන වචන වෙනුවට "8 වන වගන්තිය මගින් නියමිත ගාස්තු ප්‍රමාණවලට අනුකූලව" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි "මේ පනතේ තුන්වන උපලේඛනයේ දක්වා ඇති ප්‍රමාණ අනුව" යන වචන වෙනුවට "නියෝග මගින් නියම කරනු ලබන ගාස්තු ප්‍රමාණවලට අනුකූලව" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ "මේ පනතේ තුන්වන උපලේඛනයේ දක්වා ඇති ගාස්තු ප්‍රමාණවලට අනුකූලව" යන වචන වෙනුවට "(1) වන උපවගන්තියේ (අ) ඡේදයෙන් නියම කරනු ලබන ගාස්තු ප්‍රමාණවලට අනුකූලව" යන වචන ආදේශ කිරීමෙන්.

2—ඒ 53871 10,125 (81/02)

ප්‍රධාන ප්‍රඥප්තියේ 82අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 82 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 82අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

" නියෝග.

82අ. (1) නියම කරනු ලැබීමට මේ පනතින් නියමිත හෝ බලය දෙන ලද යම් කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරන ලද දින සිට හෝ නියෝගයෙහි සඳහන් යම් පසු දිනයක සිට හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොකළ යම් නියෝගයක් එහි අනනුමතයේ දින සිට එහෙත් එය යටතේ කරන ලද කිසිවකට ඉන් හානියක් නොවන පරිදි පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන සහ තුන්වන උපලේඛන ඉවත් කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන සහ තුන්වන උපලේඛන මෙයින් ඉවත් කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොලැබීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.